# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 454 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 15/03/2024<br>පැය 1540 |

## මාධ්‍ය නිවේදනය

**කොම්පඤ්ඤවීදිය ගුවන් හමුදා මූලස්ථානය ශ්‍රී ලංකා පොලිසිය වෙත භාර දීම - පොලිස් මූලස්ථානය.**

ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය වශයෙන් භාවිතා කල කොම්පඤ්ඤවීදියේ පිහිටි ගොඩනැඟිල්ල ශ්‍රී ලංකා පොලිසිය වෙත නිල වශයෙන් භාර දීම 2024.03.15 වන අද දින උදෑසන සිදු කරන ලදී.

එම අවස්ථාවට ආරක්ෂක ලේකම් ජනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) මහතා, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වියානි ගුණතිලක මහතා, ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් උදේනි රාජපක්ෂ මහතා සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා ඇතුළු ගුවන් හමුදාවේ සහ පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් සහභාගී විය.

දශක දෙකකට ආසන්න කාලයක් ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය වශයෙන් භාවිතා කර ඇති අක්කර 03 ක පමණ භූමි ප්‍රමාණයක පිහිටි තට්ටු 12 කින් සමන්විත මෙම මූලස්ථාන ගොඩනැඟිල්ල ඉදිරියේදී ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානය ස්ථාපිත කිරීමට නියමිතව ඇත. එය නිල වශයෙන් භාර දීම හා භාර ගැනීමට අදාල ලේඛන ගුවන් හමුදාවේ අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) එයාර් වයිෂ් මාර්ෂල් මනෝජ් කැප්පෙටිපොළ මහතා හා පොලිස් මූලස්ථානයේ මූලස්ථාන පරිපාලන අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කැළුම් තිලකරත්න මහතා විසින් අත්සන් කිරීම සිදු කරන ලදි.

අනතුරුව අදාල ලේඛන ගුවන් හමුදාපතිතුමා හා පොලිස්පතිතුමා අතර හුවමාරු කර ගැනීම සිදු වූ අතර මෙම අවස්ථාව සනිටුහන් කරමින් සමූහ ඡායාරූපයකට පෙනී සිටීම සහ සමරු තිළිණ හුවමාරු කරගැනීමක්ද සිදු කරන ලදී.

ඡායාරූප












මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.